# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1985 අංක 43 දරන
# සූතිකාධාර (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1985 නොවැම්බර් මස 20 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1985 නොවැම්බර් මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 60 යි    තැපැල් ගාස්තුව : ශත 75 යි

## 1985 අංක 43 දරන සූතිකාධාර (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1985 නොවැම්බර් මස 20 වන දින]

එල්. ඩී.—ඕ. 21/84.

### සූතිකාධාර ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1985 අංක 43 දරන සූතිකාධාර (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. 1981 අංක 52 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත (මෙහි මින්මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන) සූතිකාධාර ආඥාපනතේ 3 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ :— 140 වන අධිකාරයේ 3 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"සූතිකාධාර ගෙවිය යුත්තේ කිනම් කාල සීමාවකටද යන වග.

3. යම් ස්ත්‍රියකට සූතිකාධාර ගෙවනු ලැබීමට හිමිකම් ඇත්තේ යම් කාලසීමාවකට ද, ඒ කාල සීමාව පහත දැක්වෙන පරිදි විය යුතුය :—

(අ) ප්‍රසූතියෙන් සජීවී දරුවකු බිහි වුවහොත් සහ ඒ ස්ත්‍රියට ඒ ප්‍රසූති දිනය වන විට දරුවකු නොමැති නම් හෝ එක් දරුවකු පමණක් සිටී නම්, ප්‍රසූති දිනය ද ඇතුළුව ඒ දිනය දක්වා සති දෙකක් ද ඒ දින යෙන් ඉක්බිතිවම සති දහයක් ද යන ආකාරයෙන් සති දොළහක් ;

(ආ) (i) ප්‍රසූතියෙන් සජීවී දරුවකු බිහි වුව හොත් සහ ඒ ස්ත්‍රියට ඒ ප්‍රසූති දිනය වන විට දරුවන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සිටී නම් ; හෝ

(ii) ප්‍රසූතියෙන් සජීවී දරුවකු බිහි නොවුව හොත්,

ප්‍රසූති දිනය ද ඇතුළුව ඒ දිනය දක්වා සති දෙකක් සහ ඒ දිනයෙන් ඉක්බිතිවම සති හතරක් යන ආකාරයෙන් සති හයක් :

එසේ වුවද (අ) ඡේදයෙහි සහ (ආ) ඡේදයෙහි සඳහන් ඉහත කී සති දෙකේ කාලසීමාව ඇතුළත යම් දින ගණනක් ඒ ස්ත්‍රිය, ස්වකීය සේවා නියුක්තියෙහි සේවය කර ඇති අවස්ථාවක, ප්‍රසූතියෙන් පසුව, අවස්ථෝචිත පරිදි ඉහත කී සති දහයේ හෝ සති හතරේ කාලසීමාව අවසන්

1 - ඒ 986179--8,200 (85/10)

වීමෙන් ඉක්බිතිවම, එළඹෙන දිනයෙන් ආරම්භව ඒ දින ගණන සඳහා, සූතිකාධාර ගෙවනු ලැබීමට, ඇයට හිමිකම තිබිය යුතුය.

(2) (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් සති දොලහේ කාලසීමාව තුළ දී හෝ (ආ) ඡේදයේ සඳහන් සති හයේ කාලසීමාව තුළ දී හෝ යම් ස්ත්‍රියක මිය ගියහොත්, සූතිකාධාර ගෙවිය යුත්තේ ඇයගේ මරණය සිදු වූ දිනය ද ඇතුළුව, ඒ දිනය තෙක් පමණකි. ”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. 1981 අංක 52 දරන පනතින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය, එහි (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

“ (1) (3) වන හා (4) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව ගැහැණු කම්කරුවකුගේ සේවායෝජක විසින් ඒ කම්කරුවකුට—

(අ) ප්‍රසූතියෙන් සජීවී දරුවකු බිහිවුවහොත් සහ ඒ කම්කරු ස්ත්‍රියට ඒ ප්‍රසූති දිනය වන විට දරුවකු නොමැති නම් හෝ එක් දරුවකු පමණක් සිටී නම්, ප්‍රසූතියට පෙරාතුව ම වූ සති දෙකක කාලසීමාව සහ ඇයගේ ප්‍රසූති දිනයෙන් ඉක්බිතිව ම එළඹෙන සති දහයක කාලසීමාව යන සම්පූර්ණ කාලසීමාව සඳහා ද ; සහ

(ආ) (i) ප්‍රසූතියෙන් සජීවී දරුවකු බිහි වුවහොත් සහ ඒ කම්කරු ස්ත්‍රියට ඒ ප්‍රසූති දිනය වන විට දරුවන් දෙදෙනකු හෝ දරුවන් දෙදෙනකුට වැඩි සංඛ්‍යාවක් හෝ සිටී නම් ; හෝ

(ii) ප්‍රසූතියෙන් සජීවී දරුවකු බිහි නොවුවහොත්

ප්‍රසූතියට පෙරාතුවම සති දෙකක කාලසීමාව සහ ප්‍රසූතියෙන් ඉක්බිතිවම සති හතරක කාලසීමාව යන සම්පූර්ණ කාල සීමාව සඳහා ද, නියමිත අනුප්‍රමාණයන් අනුව සූතිකාධාර ගෙවිය යුතු ය :

එසේ වුවද, එවැනි ගැහැණු කම්කරුවෙක්, ප්‍රසූති දිනයට පෙරාතුවම වූ, (අ) ඡේදයේ සහ (ආ) ඡේදයේ සඳහන් ඉහත කී සති දෙකේ කාලසීමාව ඇතුළත, ඇයගේ සේවා නියුක්තියෙහි යම් දිනයක් තුළ සේවය කර ඇති අවස්ථාවක, ඇයට, ඒ දිනය සඳහා ද අදාළ කාලසීමාවෙන් ඒ දිනයට කලින් වූ කාල සීමාවේ කොටස සඳහා ද ඇයගේ දරු ප්‍රසූතියෙන් ඉක්බිතිව, සූතිකාධාර ලැබීමට හිමිකම තිබිය යුතු ය.”.

4. 1981 අංක 52 දරන පනතින් අවසන් වරට සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය, මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(2) දරු ප්‍රසූතියක් සිදු කළ ගැහැණු කම්කරුවකු විසින්, ඒ දරු ප්‍රසූතිය සිදු වී සතියක් ඇතුළත, ඒ ප්‍රසූතිය සිදු වූ දිනය, ඇයගේ සේවායෝජකයාට දැනුම් දිය යුතු අතර ඇයට සේවා නියුක්තියෙන් බැහැරව සිටීමට හිමිකම් ඇති දින ගණන තීරණය කිරීමේ කාර්යය සඳහා, ඒ ප්‍රසූතිය සිදු වූ දිනය වන විට ඇයට සිටි දරුවන් සංඛ්‍යාව නිශ්චිතව දැනුම් දිය යුතු ය ;" ; තවද

(ආ) ඒ වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(4) (1) වන උපවගන්තිය යටතේ හෝ (2) වන උපවගන්තිය යටතේ දැනුම් දීමක් ගැහැණු කම්කරුවකුගෙන් ලැබුණු විට, සේවායෝජකයා විසින් ඒ ගැහැණු කම්කරුවාට—

(අ) ප්‍රසූතියෙන් සජීවී දරුවකු බිහිවුවහොත් සහ ප්‍රසූති දිනය වන විට ඇයට දරුවකු නොමැති නම් හෝ එක් දරුවකු පමණක් සිටි නම්, ප්‍රසූතියට පෙරාතුවම සති දෙකක් සහ ප්‍රසූතියෙන් ඉක්බිතිවම සති දහයක් ද ;

(ආ) (i) ප්‍රසූතියෙන් සජීවී දරුවකු බිහිවුවහොත් සහ ඒ ස්ත්‍රියට ඒ ප්‍රසූති දින වන විට දරුවන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සිටි නම් ; හෝ

(ii) ප්‍රසූතියෙන් සජීවී දරුවකු බිහි නොවුවහොත් ප්‍රසූතියට පෙරාතුවම සති දෙකක් සහ ප්‍රසූතියෙන් ඉක්බිතිවම සති හතරක් ද

ඇයගේ සේවා නියුක්තියෙන් බැහැරව සිටීමට අවසර දිය යුතු ය :

එසේ වුවද, එවැනි ගැහැණු කම්කරුවෙක් (අ) ඡේදයේ සහ (ආ) ඡේදයේ සඳහන් ඉහත කී සති දෙකේ කාලසීමාව ඇතුළත ඇයගේ සේවා නියුක්තියෙහි යම් කිසි දින ගණනක් සේවය කර ඇති අවස්ථාවක, ප්‍රසූතියෙන් පසුව අවස්ථාවෝචිත පරිදි ඉහත කී සති දහයේ හෝ සති හතරේ කාලසීමාව අවසන් වීමෙන් ඉක්බිතිවම එළඹෙන දිනයෙන් ආරම්භව, ඒ දින ගණන, ස්වකීය සේවා නියුක්තියෙන් බැහැරව සිටීමට ඇයට අවසර දිය යුතු ය.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 යි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.